# පුංචි රන්දිගේ ජයග්‍රහණය



**අයන්සා වීරසිංහ**

කෘතියේ නම : පුංචි රන්දිගේ ජයග්‍රහණය

කතෘගේ නම : අයන්සා වීරසිංහ

කතෘ අයිතිය : ISBN 978-624-206-988-3

කතෘගේ වෙනත් කෘති : මගේ සූරියකාන්ත මල (2020)

කෘතිය පල කරන දිනය : 2023.12.24

# <u>පිදුම</u>

සෑම අතින්ම පොහොසත් වූ

යහපත් සමාජයක් බිහි කරලීමේ

උදාර කටයුත්ත,

සිදුකරමින් අප ඔපවත් කරන,

මහාමායා බාලිකා

**විද්‍යාලයේ විදුහල්පති තුමිය**

සහ

**මගේ පංති භාර ගුරුතුමිය**

ඇතුළු

සියළුම ගුරු මඩුල්ලට

උපහාරයක් ලෙස

මේ පොත් පිංච පිළිගන්වමි....!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

දවසක්දා රන්දි අම්මාත් සමඟ චෙස් තරඟාවලියකට ගියා.








රන්දි තරඟයට ගොස් අම්මාගෙන් මෙසේ ඇසුවා.



“අම්මා, මේ මගේ පළමුවන තරඟාවලිය නිසා මට කුසලානයක් දිනාගන්න බැරි වේවිද?” කියලා.

“එහෙම වෙන්නේ නැහැ පුතේ” අම්මා පැවසුවා. රන්දි පළමුවන තරඟ වටය සඳහා යෑමට සූදානම් වුණා. ඇය පළමුවන වටය ජයග්‍රහණය කරා.





දෙවන වටය සහ තුන්වන වටයද ඇය ජයග්‍රහණය කරා. ඇයට හරිම සතුටුයි. ඇය අම්මාගෙන් ඇහුවා

“අම්මා මට වට තුනක් දිනන්න පුළුවන් වුනා. මට ඊළඟ වට තුන දිනන්න පුළුවන් වෙයිද?” කියලා.



“උත්සාහ කරොත් පුළුවන් වේවි.” රන්දිගේ අම්මා පැවසුවා.  රන්දි සතුටින් හතරවන වටයට ගියා. ඇය එම තරඟ වටයට හුඟාක් බය වුණා. නමුත් ඇය එම තරඟ වටයත් දිනීමට උත්සාහ කරා.





ඇය එම වටය දින්නා. ඇය සතුටින් අම්මා ළඟට ගියා. අම්මාත් හුඟක් සතුටු වුණා.



"දැන් දවල් වෙලා. අපි දෙන්නා මොනවා හරි කමු." අම්මා පැවසුවා. ඔවුන් කෑම කඩයට ගොස් දවල් ආහාරය ගත්තා.

රන්දි ඒ අතරේ
අම්මාගෙන් මෙසේ
ඇසුවා. “අම්මා
අපට පස්වන
වටයට යෑමට
පරක්කු වෙන්නෙ
නැද්ද?”



“නැහැ පුතේ, පස්වන තරඟ වටය පටන් ගන්නෙ එක හමාරට. තාම වෙලාව දොළහයි හතළිස් පහයි පුතේ පරක්කු වෙන්නෙ නැහැ.” අම්මා කිව්වා.

රන්දි සහ අම්මා දවල් ආහාරය ගෙන ආපසු තරඟ වටය තිබෙන තැනට ආවා.



ඇය පස්වන තරඟ වට සඳහා යෑමට සූදානම් වුණා. ඇය එම තරඟ වටයට බය වුණා. තරඟ වටය ආරම්භ වුණා.



එම තරඟ වටය ඇයට ගොඩාක් අමාරු වුණා. නමුත් ඇය උත්සාහ කරා. ඇය එම වටය ජයග්‍රහණය කරා. රන්දිට හරිම සතුටුයි. ඇය දුව ගොස්  අම්මාට තොරතුරු කිව්වා. අම්මාට ගොඩක් සතුටු හිතුණා. “ඊළඟට අන්තිම තරඟ වටය” අම්මා පැවසුවා.



රන්දි හයවන තරඟ වටය සඳහා සූදානම් වුණා. ඒ වටයට නම් හුඟාක් බය වුණා. රන්දිට හමුවුණේ අමාරු තරඟ කරුවෙක්.

නමුත් පැය කිහිපයක් ක්‍රීඩාකර ඇය දින්නා. මෙවර ඇයටද ඇයගේ අම්මාටද හරිම සතුටුයි. ඇය ත්‍යාග ප්‍රධානෝත්සවයට සහභාගී වුණා.






ඇය මෙම තරගාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගත්තා. පුංචි රන්දිට හරිම සතුටුයි. අම්මාටත් හරිම සතුටුයි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20